**කොත්මලේ ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොත්මලේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. **මා විසින් තවදුරටත්,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලද දැන්වීම් පුවරු ආදායම් රු.134,650 ක් හා දැන්වීම් පුවරු ලැබිය යුතු ආදායම් රු.490,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 ගිණුම නිවැරදිව සකසන බව | ආදායම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයට අදාළ ණයගැතියන් අධි වෙන් කිරීම් රු.221,821 ක් සමුච්චිත අරමුදල හර කිරීමකින් තොරව වියදම් හර කර තිබුණි. | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේදී 2019 වර්ෂය වෙනුවෙන් ගෙවීම් කරන ලද විගණන ගාස්තුරු.162,000 ක් එම වර්ෂයේ වියදම් ලෙස ගැලපීමේ වරද නිවැරදි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ජ'නල් සටහන් අංක 16 මඟින් ආදායම් වියදම් ගිණුමට හා සමුච්චිත අරමුදලට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම වැඩියෙන් දැක්විණි. | ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළ විගණන ගාස්තු රු.168,000 ක් හා සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව රු.169,120 වියදම් ණයහිමියන් අඩුවෙන්ද, රු.112,986 ක ණයහිමි ශේෂ 02 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. | 2023 ගිණුම සැකසීමේදී එම වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 07 කට අදාළ මූලික පොත්/ උපයෝගි ලේඛනවල ශේෂයන් සමඟ සැසැඳීමේදී රු.7,070,811 ක නොසැසඳීමක් විය. | 2023 ගිණුම සැකසීමේදී එය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නොසැසඳීම් නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,241,843 ක් වටිනා ගිණුම් ශේෂ 04 ක් උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | 2023 ගිණුම සැකසීමේදී එය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නොසැසඳීම් නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(3) ප්‍රකාරව | 2019 ජුලි 01 දින සිට 2020 නොවැම්බර් 19 දින දක්වා අවස්ථා 09 කට අදාළ කර්මාන්ත අත රැඳවුම් රු.135,776 ක් නියාදනය කර නොතිබුණි. | ගෙවීමට හැකි රැඳවුම් මුදල් නිදහස් කිරීමට ඉතිරිය ආදායමට බැර කිරීමටත් කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,496,669 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,789,319 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| )i) | වරිපනම් හා බදු | 11,725,500 | 9,716,533 | 9,546,462 | 4,253,680 | 11,836,500 | 11,038,336 | 9,549,193 | 4,083,609 |
| (ii) | කඩ කුලී | 7,532,800 | 1,509,818 | 1,194,568 | 3,045,960 | 6,591,000 | 6,946,901 | 5,727,478 | 2,730,710 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 11,291,000 | 10,649,464 | 10,649,464 | - | 14,642,000 | 2,238,584 | 8,902,644 | - |
| (iv) | වෙනත් ආදායම් | 81,555,000 | 15,294,335 | 16,537,508 | 6,584,270 | 77,928,500 | - | 81,345,847 | 7,827,443 |
| | | 112,104,300 | 37,170,150 | 37,928,002 | 13,883,910 | 110,998,000 | 20,223,821 | 105,525,162 | 14,641,762 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු<br>------------------- | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.4,472,458 ක හිඟ ශේෂයක් පැවති අතර හිඟය තුළ වසර 01 සිට 05 දක්වා වරිපනම් පරිශ්‍ර 1511 කින් අයවිය යුතු රු.1,739,976 ක ශේෂයක් හා වසර 05 ට වැඩි වරිපනම් පරිශ්‍ර 258 කින් අයවිය යුතු රු.549,504 ක ශේෂයද පැවතුණි. | 2023 වර්ෂයේ හිඟ ආදායම් අය කිරීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ආ) | වෙනත් ආදායම්<br>------------------ | | |
| i. | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.2,711,510 ක ත්‍රී රෝද රථ කුලී හිඟයෙන් අය කිරීම රු.710,000 ක් හෙවත් සියයට 26 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා බිල්කිරීම් වූ රු.1,475,900 න් රු.424,300 ක් හෙවත් සියයට 29 ක් පමණක් අය කරගෙන තිබුණි. | හිඟව පවතින මුදල් අධිකරණයට වාර්තාකර අයකර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| ii. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල ගාස්තු හිඟය රු.526,150 ක් වූ අතර 2022 වර්ෂයේ බිල්කළ ජල ගාස්තුවලින් රු.354,295 ක් අයකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දින පැවති රු.869,425 ක හිඟ ශේෂය තුළ වසර 01 සිට වසර 05 දක්වා කාලයක සිට පුද්ගලයින් 86 ක ගෙන් අයවිය යුතු රු.486,400 ක ශේෂයක් හා වසර 05 ට වැඩි කාලයක සිට පුද්ගලයින් 31 ක ගෙන් අයවිය යුතු රු.161,645 ක ශේෂයක් හිඟව පැවතුණි. | තවදුරටත් අය කිරීමට ඇති හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>------------------------------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.947,740 ක් හා මුද්දර ගාස්තු රු.5,636,800ක් විය. | ඉදිරියේදී අය කර ගන්නා බව | හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 85 (ආ) වගන්තිය අනුව කටයුතු නොකර බල ප්‍රදේශයේ පිහිටි පොදු වැසිකිළි 04 ක් නඩත්තුවකින් තොරව විනාශ වීමට ඉඩහැර තිබුණි. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 (ඇ) අනුව කටයුතු නොකර කොත්මලේ නව නගරයේ සතිපොල ඉඩම හා ගොඩනැඟිලි භාවිතයකින් හා නඩත්තුවකින් තොරව විනාශ වීමට ඉඩහැර තිබුණි. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ III කොටස 27 පරිච්ඡේදය අනුව මාර්ග ඉන්වෙන්ට්‍රියක් නොතිබුණි. | 2023 වර්ෂයේදී ක්‍රියා කිරීමට කටයුතු කරන බව | ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | පෞද්ගලික ව්‍යාපෘතියකින් මල්දෙණිය හා පුඩළුඔය පුස්තකාල දෙක සඳහා ඉගෙනුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අවශ්‍ය ලිපිද්‍රව්‍ය, ලැප්ටොප් පරිගණක,මල්ටි මීඩියා ෆොටෝකොපි යන්ත්‍ර හා කාර්යාල උපකරණ පරිත්‍යාග ලෙස 2022 ජනවාරි 08 දින ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අදාළ ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | 2023 ජූනි මස සිට අදාළ තොරතුරු සම්පත් මධ්‍යස්ථානය ආරම්භ කිරීමට කටයුතු කරන බව | අදාළ ව්‍යාපෘතිය ආරම්භ කළ යුතුය. |
| (ඉ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 (ඇ) අනුව විදීවල තිබෙන සියලුම කසළ, නිවාසවල තිබෙන කසළ, සහ මල බැහැර කිරීම සඳහා ස්වකීය ප්‍රදේශය තුළ හැකිතාක් දුරට සියලු පියවර ගැනීම සභාවේ කාර්යයක් විය යුතු වුවද, කොත්මලේ නව නගරයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ මධ්‍යස්ථානය භාවිතයට නොගෙන විනාශ වීමට ඉඩහැර තිබුණි. | ප්‍රදේශයේ ජනතාවගේ විරෝධය නිසා පසුගිය කාලයේ දිගින් දිගටම භාවිතයට ගැනීමට අපොහොසත් වූ බව | ඵලදායී කාර්යක යොදවා ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයට අදාළ රු. 58,610,536 ක ණයහිමි ශේෂ 87 ක් නිරවුල් කිරීමට සහ රු.9,690,235 ක ණයගැති ශේෂ 246 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂය තුළදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව | ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරීක්ෂණයට භාජනය වු සුසාන භූමි 07 ක මායිම් සළකුණු කර නොතිබුණු අතර භූමිදාන කටයුතු සඳහා සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | වත්කම් නිසි ලෙස නඩත්තු කර සුරක්ෂිත කිරීමටත් ,උපයෝජනය කිරීමටත්, පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුස්තකාල ගොඩනැගිල්ලි, කඩකාමර හා සභාවේ නිවාස ඇතුළු ගොඩනැගිලි 14 ක් නඩත්තුවකින් තොරව විනාශ වීමට ඉඩ හැර තිබුණි. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති වටිනාකම ගණනය නොකළ යන්ත්‍ර උපකරණ 07 ක් හා ලී බඩු හා කාර්යාල උපකරණ 04 ක් හා වාහන 02 ක් වසර 01 සිට වසර 20 දක්වා කාල පරාසයක සිට නිශ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | ගිලන් රථ දෙක අලුත්වැඩියාවට කටයුතු කරන අතර පරිගණක යන්ත්‍ර හා කාර්යාලීයය උපකරණ භාවිතයට ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව | අළුත්වැඩියා කර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය පරිපාලන) රීති 177, 178 (5) අනුව ටෙන්ඩර් කැඳවීමකින් හෝ 178 (3) හා 178 (3) (2) හි සඳහන් විධිවිධාන පිළිබඳ අවධානය යොමු නොකර ඊට පරිබාහිරව කටයුතු කර විවෘත ටෙන්ඩර් ක්‍රියා පටිපාටියෙන් බැහැරවීමේ අරමුණින් රු.12,000,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තු අගයක් සහිත බස්නැවතුම්පල ඉදිකිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තු අගය රු.2,000,000 බැගින් ඇස්තමේන්තු 06 ක් පිළියෙල කර සමිති 04 කට ඉදිකිරීම් පවරා සමාලෝචිත වර්ෂයේ අවසාන දිනයට රු.10,047,150 ක් ගෙවා තිබුණි. | මෙම කර්මාන්තය 2021 සිට 2022 දෙසැම්බර් දක්වා අදියර 06ක් යටතේ ක්‍රියාත්මක කර ඇති බව | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. 5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 11 ක පුරප්පාඩු 20 ක් පැවති අතර තාක්ෂණ නිළධාරීන් තනතුරු 02 ක හා තාක්ෂණ සහයක තනතුරු 02 ක් පුරප්පාඩු වී පැවතීම සභාවේ ඉදිකිරීම් කටයුතු, අනවසර ඉදිකිරීම් පරීක්ෂණ කටයුතු ඉටු කිරීමේදී බාධාවක්ව පැවතුණි | පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන කොමසාරිස් සහ අමාත්‍යාංශයේ ප්‍රධාන ලේකම් තුමා දැනුවත් කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු කාර්යයන් හා ඉලක්ක සපුරා ගැනීමේ මට්ටම සංඛ්‍යාත්මකව කාර්ය සාධන වාර්තාවේ දක්වා නොතිබුණි. | 2023 ක්‍රියාකාරි සැලැස්ම තුළ අදාළ ඉලක්ක සපුරාගත් මට්ටම සංඛ්‍යාත්මකව ඉදිරිපත් කරන බව | කාර්ය සාධන සැලැස්ම නිසි ලෙස පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් ප්‍රධාන කාර්යයන් 04 ක් ඉටුකර නොතිබුණි. | 2023 වර්ෂයේදී ක්‍රියා කිරීමට කටයුතු කරන බව | ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 12 සිට සියයට 74 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 07 සිට සියයට 49 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලනකාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | පැවති කොරෝනා වසංගත තත්ත්වය තුළ පැවති ආර්ථික පසුබිම තුළ ඉන්ධන මිල ඉහල යාම වැනි සමස්ත ආර්ථික තත්වයන්ද හේතුවෙන් විචලනය ඇති වී ඇති බව | අවශ්‍යතාවය සලකාබලා අවධානයෙන් හා නිසි සැලකිල්ලෙන් අයවැය පිළියෙල කළ යුතුය. |

## 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බල ප්‍රදේශයේ දිනකට කසළ ටොන් 3.5 ක් පමණ එකතු කරන අතර එම කසළ කළමනාකරණයකින් තොරව හපුගස්තලාව ප්‍රදේශයේ වලකට බැහැර කර තිබුණි. හැරෝවත්ත කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ නොදිරන කසළ ගිනි තබා තිබුණු බැවින් දැඩි පාරිසරික හානියක් සිදු වෙමින් පැවතුණි. දිරන කසළවලින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | නොදිරන කසල එකතු කරන රථයට විශාල වශයෙන් කසල එකතුවීම හා රටේ පැවති ඉන්ධන ගැටලුව හේතුවෙන් මෙසේ කටයුතු කර ඇති බව | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුය. |

## 4.4 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වසර සඳහා සභාව විසින් 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක පිහිටුවාගෙන නොතිබුණි | 2023 වර්ෂය සඳහා ඉලක්ක පිහිටුවා ගෙන කටයුතු කරන බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |